# කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

## පුරප්පාඩු

**කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2026.05.25** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර:- කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා භාරකරු)**

01.අ.පො.ස.(සා.පෙළ) විභාගයේ
- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රිසි භාෂාව/ඉංග්‍රිසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් එක් වරක දී සමත් වී තිබීම

**සහ**

**02.** අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

අ. පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිලිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම

**සහ**

ආ.පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිලිබඳ වසර 02 ක පළපුරුද්දක් තිබීම

**සහ**

**03. ගබඩාකරණය** පිළිබඳ අවම වශයෙන් එක් අවුරුදු පළපුරුද්ද සහ/හෝ අ.පො.ස (ස.පෙළ) විභාගයේ වාණිජ්‍යයවිෂය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගණකාධිකරණ විෂය සමත් වීම.

**සටහන:** උසස් අධ්‍යාපන ආයතනය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් (Security deposit) තැබිය යුතුය.

**සටහන :- සුදුසුකම්**
**(a)** ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
**(b)** අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 නොවැඩි විය යුතුය.
**(c)** මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

**වැටුප් ක්‍රමය : U MN 1 (III) - Rs. 49,475-17x540-58,655 p.m.**
**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සේවා කොන්දේසි:**

01. මෙම තනතුර ස්ථිර ය. පත්වීම් වසර තුනක (3) ක පරිවාස කාලයකට යටත් වේ.
02. තෝරාගත් අපේක්ෂකයින් දැනට රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම් ඔහුගේ / ඇයගේ නිදහස් කිරීම ලබා ගත යුත්තේ අදාළ පත්කිරීමේ අධිකාරිය හරහා ය . රජයේ සේවකයින්ට විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට සුදුසුකම් නොලබයි.

**ප්‍රතිලාභ :**

01. තෝරාගත් අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 08% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපට ද 07% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
02. එයට අමතරව 03% ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.
03. ඉහත වැටුපට අමතරව, රජයේ අනුමත දීමනා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ද අදාළ කාර්ය මණ්ඩලයට ගෙවනු ලැබේ.

විශේෂ සටහන: කළමනාකරණ සේවා චක්‍රලේඛ 6/2025 හා විශ්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 2/2025 (i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :**

අයදුම්පත් කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වෙබ් අඩවියෙන් (http://uciars.cmb.ac.lk) බාගත කර ගත හැකිය. එක් එක් තනතුරට අදාළ වන පරිදි වෙබ් අඩවියේ ලබාදී ඇති නියමිත අයදුම්පත්‍ර භාවිතා කර අයදුම්පත් ඉදිරිපත් කරන්න (අදාළ තනතුරට සම්බන්ධ අයදුම්පත්‍රය පිරවීම අනිවාර්ය වන අතර එසේ නොකළහොත් ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාල සහතිකවල ඡායා පිටපත් සමඟ 2026.05.25 දිනට හෝ ඊට පෙර "නියෝජ්‍ය ලේඛකාධිකාරි, කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල සේවයේ/ රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල/ අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත
හම්බන්තොට.
2026.05.03